# අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රදේශයෙන් අනාවරණය කරගත් ශිලාලේඛන පිළිබඳව මූලික අධ්‍යයනයක්

ආර්.ජ්. බුද්ධික ධනංජය රණසිංහ, පී.එම්. සකුනි යශෝධා හතරසිංහ
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
buddhikaranasingha91@gmial.com, sakunihatharasinghe@gmail.com

---

මූලඓතිහාසික අවධියේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ අක්ෂර කලාව පිළිබඳව ද්‍රව්‍යාත්මක සාධක සපයන ප්‍රමුඛ මූලාශ්‍රයක් ලෙස ශිලාලේඛන හඳුන්වාදිය හැකිය. විවිධ කාල සීමාවන්ට අයත් ශිලාලේඛන ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති හෙයින් තවමත් හඳුනාගෙන නොමැති ලේඛන ප්‍රමාණය විශාලය. මෙම පර්යේෂණයේ අරමුණවන්නේ අහඹු ගවේෂණයකින් සොයාගත් මෙතෙක් ප්‍රකාශයට පත් නොවූ ශිලාලේඛන කිහිපයක් අනාවරණය කිරීම සහ ඒවා කියවා ඉන් හෙළිවන ඓතිහාසිකත්වය අනාවරණය කිරීමය. මේ සඳහා අනුගමනය කළ ක්‍රමවේද අතර ක්ෂේත්‍රගතව ශිලාලේඛනය පිටපත් කරගැනීම සහ පූර්ව කියවීම් ආශ්‍රය කරගනිමින් ලේඛනය කියවීමට උත්සාහ කිරීම මූලික වේ. පර්යේෂණයට බඳුන් වූ ශිලාලේඛන ත්‍රිත්වය අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගිරාගොඩ හා නියදවරාගල ප්‍රදේශයෙන් හඳුනාගනු ලැබිණි. එම ශිලාලේඛන අතරින් කිහිපයක් බොහෝ සේ හායනයට ලක්ව ඇති අතර ලේඛන ද්විත්වයක් කියවා ගත හැකි මට්ටමේ පවතියි.

ප්‍රමුඛ පද: ගිරාගොඩ, නියදවරාගල, ශිලාලේඛන